# මංගල සමරවීර



‘ගං  මල’ පිපුන, දකුණේ ඇති හැකි ලොකු        ගෙයක
මං   ගල  රාජකීයයෙකි, අකුරු කල අප හා සම        කලෙක
ඉං   ග්‍රිසි  සාහිතය නම් අතිරස පිරි, රස        ගඟක
හං   ගල  ඇති රස සොයා කිමිදුණි, ඔහු එක්        කලක

නූලක්        කළු තිබුන මතකයි, ඔහු ගෙල        පළඳා
තරමක්        ලොකු, සාමයෙ ලකුණක් තිබි, එහි        රන්දා
යතුරක්,        හා කැලි බැලි තොගයක් ඒ සමගින්        ආදා
පෙනුමක්        ‘ට්‍රෙන්ඩි’ තිබුණා, කමිසෙ උඩ බොත්තම        ඇරදා

පිය        මහානාම විය, නීතිය හා වම ඔහුට එක ලෙස        හුරුය
පිය        සෙනෙහස දස අවුරුදු වියේදිම මංගල හට අහිමි        විය
මිය        ගිය මුත් පියා, මව කේමා දරු සෙනෙහස ඉතිර        ගිය
ලය        මංගල සදා මව් ගුණ ගැයෙනා රන් දෙවොල        විය

උගෙන        මනා සිප්, හැඩ මවනට පෙහෙකම් ආයිත්තම් ඇ        රුසක
ප්‍රගුණ        කල ශිල්ප දුන් පන්නරය විදහා සුවිසෙස් නැවුම්        ආරක
යන්න        ආ දිවි ගමන විලාසිතා ලොව දිනනට, අමතක කර වෙන        අතක
තීරණය        කළා යන්න, දේශපාලනය තුල පෙරළිකාර        ගමනක

හුරු        බුහුටිය, ගති ගුණ, කතා බහ, ඒ  හැම මටසිලුටු        විය
බොරු        චාටු නැත, කිව්වා මූනට ම අමුවෙන් කියන        දෙය
සුරු        අත දකුණ නොව, සුරු ඔහු හට සිය වමත        විය
දැරු        මත ‘මැද දකුණ’? ‘රැඩිකල්  කම’ එහි නොමද        විය

තනතුරු        ගෙනා රහස මව් පිය උරුමය නොව ඔහු හැකියාව        විය
ගරු සරු        කළා ගරු කටයුතු හැමට සැම දා පා බුහුමන්        සෙනේහය
නැති බොරු        සෝබන, චාටු, මුසා බස්, වැඩ කෙරුමට ම කැප        විය
උවදුරු        කලින් දැක පිළියම් සොයන හැකියාවක් ඔහු කෙරේ        විය

සුනාමියෙන්        රට වැනසුණු දෙදහස් හතර ඒ        වසරේ
කඩිනමින්        සැලසුම් කළා නව මාතර සොඳුරු        පුරේ
රට රටින්        ලැබ උදව් සදමින් රෝහල්, පාලම් නව        ආරේ
නියමුවන්        ලෙස වැඩ කළා ඇතැමෙක් ගිය ද, හොර        පාරේ

ආවත්        අපි සමාජයෙ, දුර තල දෙකක,        දෙ විදියක
එදත්        සිප් කළා සුහදව ළඟ පුටු දෙකක, එක        පන්තියක
යලිත්        හුමු වූ කල පාසැල හැර ගොස් වෙනස් ම  දෙ        මගක
මටත්        පුදුම 'පකුම්' නැති ඒ මංගලම ය ඔබ, අප දත්        පෙරදාක

ආරක        අමුතු පන්නරයකි, මින් පෙර        නොවුණු
පාරක        අලුත් යන්නට, කිසි විට බිය        නොවුණු
මාරක        දැක දැකත්, පෙරටම ගිය යට        නොවුණු
තීරක        දේශපාලන ගඟ, මං සලකුණු        කෙරුණු

හරි        හෝ වැරදි හෝ ගත් තීරණ අනුව        යන
බරි        දේශපාලනේ කුණු ගඳ හොඳටම        දැනුන
මරි        මෝඩකම් දැක නිහඬව නිවටව        සිටින
නරි        වාදම් දෙසන උන් හට වහ කදුරු        වුන

කළු        සුදු පාට දෙක අතර ඇති දිග පළල මත        තීරේ
අළු        පාට දුර්මත ගල ගලා, එය තව තව පුලුල්        කෙරේ
මුළු        දේශපාලනයම මූසල අළු පාටකි අද ලක්        අඹරේ
කළු        සුදු දිටි සමනලයෙකි  ඔබ, ඒ කූඩැල්ලන්        අතරේ

මිනිසුන්        ගරු කරන සිව් පසයෙන් පුද        ලබන
තිරිසන්        මුසා දෙසා දන සිත් මරු විස        කවන
දූදනන්        ගැන නොබියව නිසැකව හඬ        නගන
මිනිසුන්        ඔබ වගේ නැත තව අප ලක්        දෙරණ

බොදු        ප්‍රතිපත්ති සුරකුවෙ ඔහු හද තුල, සහ කල        සේවාවේ
සුදු        ඇඳ තඩි බ බා පපුවට තැන තැන වැඳ වැටී        නොවේ
පොදු        දන මුදල් ගසා කෑමක කිසි දින නියැලුනා        නොවේ
රුදුරුව        උන් ඔබ හඹා ආවේ, ඒ බව නොදැන        නොවේ

මිනිසුනි        අවදිව බලව්, කිම වනුයේ තොප        'දරු රටට'
බිහිවුනි        කූඩැල්ලන් වැනි නයුවන් ලේ බොනවා සිතු        ලෙසට
වැනසුනි        වනය, අප සම්පත් සින්න විය, අන්        රටට
පැවසුනි        සමනලයන් කූඩැල්ලනට වඩා වටිනව මේ        රටට

සමනළයන් වුව හොඳයි රොන් ගෙන පල සරු        කරනා
කූඩැල්ලන් කුමට එල්ලී, අත නැරම ලේ බී තර        වෙන්නා
මිනිසුන්        නොමිනිසුන් මනිනා තරාදිය උන් කර        පින්නා
අවමන්        කරති මිනිසත්කමට, ජරා ජඩ වැඩ        කරමින්නා

ගනඳුරු        වලාවක වුව ලස්සන රිදී ඉරි තනියම හෝ        ඇන්දා
‘අත දරු’        ලෙස සලකා, ලක් මව කෙරේ දැඩි පෙම් හද        රන්දා
වෙද ගුරු        කම්කරු ගොවි වියතුන් බළ ඇණි යලි යලි        කැන්දා
උඩුකුරු        කරනට දේශපාලක හොරු, ඔහු නව සැලසුම්        ඇන්දා

ශ්‍රීපති,    අනුර හා ඔබ එක විට රජයෙන් පිටමන්    වූවා
ශ්‍රීපති    මැති සබේ දෙවනත් කර ලොකු රහසක්    කීවා
තැති ගති    එදා, ශ්‍රීපති මරණය ගැන කසු කුසු    ආවා
එඩි ගති    තිබුන සටන් සභයෙක් ඉන් නැති    වූවා

අඩුව    ශ්‍රීපති නැති, පුරවනු බැරි බව    පෙනුනා
නඩුව    චන්ද කොල්ලයෙ, එලෙසින් යට    ගැහුනා
කඩුව    නීතියෙ දෙවඟනගෙ කොපුවට යලි    ඇදුනා
පුඩුව    මළ ඒ අහිංසකයෙක් ගෙල මත    රැඳුනා?

රැඩිකල්    මැදක් ඇරඹුවෙ යලි ගමනක්    අරඹන්න
වැඩිකල්    නොයා පෙරලිකට ජන සේනා    කැඳවන්න
මහ පල්    හොරුන්ගෙන් අප 'දරු බිම' මුදවා    ගන්න
සැම කල්    රැකෙන සාමය සතුට, දන වෙත    දෙන්න

පනස්    හයේ දරුවෙකි, මංගල රටට කිසියම් වැඩක්    කල
පනස්    හයේ දරුවනි, සොඳුරු අදහස් පිරි තරුණ    කැල
වෙනස්    වූ සමාජය, කැරකී ඇවිත් තැනට ම  එය තිබුන    මුල
නැණැස්    හැර පිබිද බලනුව, රට පැටලී ඇති මේ මහ    අවුල

මැතිඳ    ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කල ඒ අඳුරු    දින
නැතිද    ඔබ හැඬුවෙ? හැඳිනුව ඔබ, මුළු රටටම විපත    වූන
අද ද    ලකඹර අඳුරුය, නිකිණි සඳ වන් ඔබ බැස    ගියෙන
කවුද    අඩුව සදනුයෙ?  ලකඹර පායා බිනර සඳ සේ    දිලෙන

ගං මල    පරවෙලා අළු වී ඇවුනා, දර නැති සෑයක    හනික
මංගල    නික්මුනේ මුළු රටට ම, ඔහු නැතිවම බැරි    කලක
හංගල    ඇති කොහේ හරි, දැය නංවන සැලසුම්    සුරැක
නංවල    වැඩට ගනු 'රැඩිකල් මැද', සැලසුම් ඒ හැම    හනික

නගර    අලංකරණය - කොළඹ, හා පුංචි බොරැල්ලේ    බෝධිය
නිතර    පැසසෙන ටෙලිකොම් සේවා නැගුම හා    නව්‍යකරණය
මාතර    අලංකරණය, නව නගරය සහ පුළුල්    කරණය
අතර    දිගු කලක් රැඳේ, ඔබ කල සේවයේ සොඳුරු    මතකය

දර    නැති සෑයෙන් වුව කුරුළු සුවඳක් ගුවනට මුසු    වූයේ
පෙර    නැති සරු ගරු බවක් ඔබ ගැන මහදට වුව ඉන්    ආයේ
පෙර    හුරු නැති අපත්, රට රකිනා පෙරමුණකට    කැන්දූයේ
අර    ගමු හිතට නව දිරියක්, රට ගොඩ ගමු අපි    ආයේ!

මාතර    පුරේ බැබලුව ඒ ‘බෙමගෙ    කොලුවා’
මාතර    පුරේ බැබලුන ‘මහනාමගෙ    දරුවා’
පාහර    කම් නැති පින් පිරි පින්සිරි    නයුවා
චාමර    යක්, පුන්කලසක් විය මංගල    විරුවා

රටට    නායකත්වය 'මැද රැඩිකලෙන්' වමට බර කර    දෙන්න
පාට    නැති ජන බලයක් හදනට මංගල ඔබ යලි මෙහි    එන්න
කාට    වත්ම බැහැ ජන සේනා එක්ව රට ගොඩ ගනු    නවතන්න
මීට    වඩා කෙටි මගක් නැහැ තව - නිවනට    පිවිසෙන්න!

**ඉංජිනේරු ශ්‍රේෂන් ඒ. පීරිස්** - මෙල්බෝර්න් නුවර සිට

(රාජකීය 1970 කණ්ඩායම)